# විශිෂ්ට පරමාදර්ශී අභිමානවත් පළාත් සභා රාජ්‍ය සේවයක්

## පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත
## மாகாண சபை அரசாங்க சேவை ஆணைக்குழு – மேல் மாகாணம்
## PROVINCIAL COUNCIL PUBLIC SERVICE COMMISSION – WESTERN PROVINCE

අංක 628,10 වන මහල,ජන ජය සිටි ගොඩනැගිල්ල,නාවල පාර,රාජගිරිය இல.628, 10 வதுமாடி, ஜனஜயசிட்டிவளாகம், நாவலவீதி, ராஜகிரிய No.628,10th Floor,Jana Jaya City Building,NawalaRoad,Rajagiriya


| මගේ අංකය / எனது இல. / My Ref. | WPC/PSC/EXM/02/TO-I&II/EB/2026 | ඔබේ අංකය / உமது இல. / Your Ref. | | දිනය / திகதி / Date | 2026.03. 26 |
|---|---|---|---|---|---|

ප්‍රධාන ලේකම්, (බ.ප.),
ආණ්ඩුකාර ලේකම්, (බ.ප.),
සභා ලේකම්, (බ.ප.),
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු, (බ.ප.),

**<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ සහ II ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2019 II (2026)</u>**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2,480 හා 2026.03.13 දිනැතිව ප්‍රසිද්ධ කරන ලද ගැසට් පත්‍රයේ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මඟින් පළකර ඇති නිවේදනය අනුව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ සහ II ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2019 II (2026) සඳහා අයදුම්පත් කැඳවා ඇත.

02. ඉහත ගැසට් නිවේදනයේ විධිවිධාන අනුව මෙම විභාගයට පෙනී සිටීම සඳහා බස්නාහිර පළාත් සභාවේ සේවයේ නියුතු බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ සහ II ශ්‍රේණියේ නිලධරයන් සඳහා ද අවස්ථාව ලබා දීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව තීරණය කොට ඇත. එම කාර්යක්ෂමතා කඩඉම් විභාගයන්ට අයදුම් කිරීම සඳහා පහත දක්වා ඇති උපදෙස් අනුගමනය කළ යුතුය.

2.1 අංක 2,480 හා 2026.03.13 දිනැති ගැසට් නිවේදනයේ සඳහන් පරිදි ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ <u>www.doenets.lk</u> වෙබ් අඩවියේ "Our Service" යටතේ ඇති "Online Applications – Recruitment Exams/ E.B. Exams" ඔස්සේ පළකර ඇති අයදුම්පත මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ සම්පූර්ණ කළ යුතුය. මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් භාරගැනීම **2026 මාර්තු මස 26 දින පෙ.ව. 9.00**ට ආරම්භ වන අතර **2026 අප්‍රේල් මස 17 දින ප.ව. 9.00**න් අවසන් වේ.

2.2 බස්නාහිර පළාත් සභාවේ සේවයේ නියුතු බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ සහ II ශ්‍රේණියේ නිලධරයන් සඳහා වෙන වෙනම අයදුම්පත් දෙකක් උඩුගත කෙරෙනු ඇති අතර තමන්ගේ ශ්‍රේණියට අදාළ වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය නිවැරදිව තෝරාගෙන අයදුම්පත සම්පූර්ණ කළ යුතුය.

2.3 අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකය සමඟ **2026.04.27** දිනට හෝ ඊට පෙර **<u>"ලේකම්, පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප), අංක 628, 10වන මහල, ජන ජය සිටි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය"</u>** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදිය යුතුය. (අයදුම්පත් භාරදීමේ අවසාන දිනය පසු වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වගකියනු නොලැබේ.)

2.4 පළමු වරට මෙම විභාගයට අයදුම්කරන නිලධරයන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එසේ වුවත් ඉන්පසු වාරවලදී නිලධරයන් විභාගයට පෙනී සිටින්නේ නම් එක් විෂයක් සඳහා විභාග ගාස්තුව රු.250.00 කි. විභාග ගාස්තුව ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන ගාස්තු ගෙවීමේ ක්‍රමවේද පමණක් අනුගමනය කළ යුතුය.


| ලේකම් / செயலாளர் / Secretary | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් / சிரேஷ்ட உதவிச் செயலாளர் / Senior Assistant Secretary | සහකාර ලේකම් (බඳවාගැනීම්) / உதவிச் செயலாளர் (ஆட்சேர்ப்பு) / Assistant Secretary (Recruitment) | සහකාර ලේකම් (ආයතන) / உதவிச் செயலாளர் (தாபனம்) / Assistant Secretary (Establishment) | පරිපාලන නිලධාරි / நிர்வாக உத்தியோகத்தர் / Administrative Officer | කාර්යාලය / அலுவலகம் / Office: 011 2879613, 011 2879614; ෆැක්ස් / பெக்ஸ் / Fax: 011 2879512; ඊ-මේල් / ஈமெயில் / E-Mail: ppscwpse@sltnet.lk |
|---|---|---|---|---|---|
| 011 2879528 | 011 2879317 | 011 2879610 | 011 2879538 | 011 2879517 | |

2.5 නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද හා ආයතන ප්‍රධානියා විසින් නිසි පරිදි සහතික නොකරන ලද අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2.6 ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසුව අයත් සේවය / පළාත සංශෝධනය කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

03. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Service" යටතේ ඇති "Online Applications – Recruitment Exams/ E.B. Exams" ඔස්සේ පළකර ඇති අයදුම්පත මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ සම්පූර්ණ කළ යුතුය. මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් භාරගැනීම **2026 මාර්තු මස 26 දින පෙ.ව. 9.00ට** ආරම්භ වන අතර **2026 අප්‍රේල් මස 17 දින ප.ව. 9.00න්** අවසන් වේ. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකය සමඟ **2026.04.27** දිනට හෝ ඊට පෙර **"ලේකම්, පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප), අංක 628, 10වන මහල, ජන ජය සිටි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදිය යුතුය.

04. ඒ අනුව ඔබ ආයතනය යටතේ සේවයේ නියුතු බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ සහ II ශ්‍රේණියේ නිලධරයන් උක්ත කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්බන්ධයෙන් දැනුවත් කරන්න.

05. ඉහත සඳහන් නිවේදනයේ විධිවිධාන සලසා නොමැති ඕනෑම කරුණක් පිළිබඳව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වන්නේය.

තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

Tel – 0112879528
Fax – 0112879512
Email – ppscwprec@sltnet.lk